රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
அரசாங்க நிர்வாக மற்றும் உள்நாட்டலுவல்கள் அமைச்சு
Ministry of Public Administration and Home Affairs
ග්‍රාම නිලධාරි පාලන අංශය
கிராம அலுவலர் நிர்வாகப்பிரிவு
Grama Niladhari Administration Division

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07. சுதந்திர சதுக்கம், கொழும்பு 07. Independence Square - Colombo 7.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දුරකථන | 2696381 | ෆැක්ස් | | ඊ මේල් | sas-gn@pubad.gov.lk | වෙබ් අඩවිය | |
| தொலைபேசி | 2698456 | பெக்ஸ் | 2696381 | இ-தபால் | as-gn@pubad.gov.lk | இணையத்தளம் | www.pubad.gov.lk |
| Tel | | Fax | | E- mail | itkg-gn@pubad.gov.lk | Web site | |

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | HAF-3-TRANS-07-027 | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2010.08.16 |

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

## <u>ග්‍රාම නිලධාරි සේවයේ ස්ථාන මාරුවීම් පොදු ප්‍රතිපත්ති මාලාව ක්‍රියාත්මක කිරීම</u>

ග්‍රාම නිලධාරින්ගේ ස්ථාන මාරුවීම් සම්බන්ධව ග්‍රාම නිලධාරි වෘත්තිය සමිති හා දිස්ත්‍රික් ලේකම්වරුන් ඉදිරිපත් කරන ලද යොජනා පිළිබඳවද සලකා ආයතන සංග්‍රහයේ III වන පරිච්ඡේදයේ සඳහන් විධිවිධානයන් හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීති අංක 1589/30 හි XVIII වැනි පරිච්ඡේදයේ විධිවිධානයන්ට අනුව ක්‍රියා කිරීම සඳහා සකස් කල පොදු ප්‍රතිපත්ති මාලාව මේ සමඟ එවමි.

02. මෙම පොදු ප්‍රතිපත්ති මාලාව අනුව 2011 වර්ෂයේ ජනවාරි මාසයේ සිට ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුල ස්ථාන මාරු සඳහා ප්‍රාදේශීය ලේකම් විසින්ද, දිස්ත්‍රික්කය තුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අතර ස්ථාන මාරුවීම් සඳහා දිස්ත්‍රික් ලේකම් විසින්ද, ඉල්ලුම්පත් කැඳවීමටත් එම ස්ථාන මාරු සලකා බැලීම සඳහා මාරු මණ්ඩල හා අභියාචනා මණ්ඩල අදාල පරිදි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා දිස්ත්‍රික් ලේකම් මට්ටමෙන් පත් කිරීමටත් මෙම මණ්ඩල වල නිර්දේශ අනුව ස්ථාන මාරු ලබා දීම සඳහා අවශ්‍ය පියවර ගැනීමටත් කටයුතු කල යුතුය.

03. වාර්ෂිකව මෙම ස්ථාන මාරු ප්‍රතිපත්තිය අනුව කටයුතු කල යුතුවේ.

04. මෙම ස්ථාන මාරු ප්‍රතිපත්තිය පිළිබඳව ඔබ දිස්ත්‍රික්කය තුල /ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුල සියළුම ග්‍රාම නිලධාරින් දැනුවත් කිරීමට පියවර ගන්නා ලෙසද කාරුණිකව දන්වමි.

ඩී. දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය

# ග්‍රාම නිලධාරින්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම් - ප්‍රතිපත්ති

## (අ) මාරු මණ්ඩල මගින් මාරුවීම් කිරීමේදී අනුගමනය කළ යුතු පොදු ප්‍රතිපත්ති.

01. සියළුම වාර්ෂික ස්ථාන මාරු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාරු මණ්ඩලයේ නිර්දේශය මත ප්‍රාදේශීය ලේකම් විසින්ද, දිස්ත්‍රික්කය තුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අතර ස්ථාන මාරුවීම් දිස්ත්‍රික් මාරු මණ්ඩලයේ නිර්දේශ මත දිස්ත්‍රික් ලේකම් විසින්ද, දිස්ත්‍රික් අතර ස්ථාන මාරුවීම් අමාත්‍යාංශ මාරු මණ්ඩලයේ නිර්දේශය මත අමාත්‍යාංශ ලේකම් විසින්ද සිදු කරනු ඇත.

02. විශේෂ අවස්ථාවකදී හැර සියළුම ස්ථාන මාරුවීම් ජනවාරි පළමු වැනිද සිට ක්‍රියාත්මක විය යුතුයි.

03. එක් වසමක වසර තුනක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් මාරුවීම් ඉල්ලීමට සුදුස්සන් වන අතර, වසර පහක් එකම වසමක සේවය කර ඇති නිලධාරීන් ඉදිරි වගන්තිවල සඳහන් ව්‍යතිරේකයන්ට යටත්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුල වෙනත් වසමකට මාරු කිරීමට යටත් වේ.

04. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් පත්වීම් ලද නිලධාරීන්ට ස්ථිර සේවයට පත්වී වසර තුනක් අවසන් වන තෙක් ස්ථාන මාරු සඳහා ඉල්ලීම් කිරීමට හිමිකම් නොමැත.

05. එක් කොට්ඨාසයක වසර පහක් සේවය කර ඇති නිලධාරීන් අනිවාර්යෙන්ම ස්ථාන මාරු කළ යුතු අතර, දුෂ්කර සේවා ස්ථානයක වසර තුනක් සේවය කරන නිලධාරීහු මාරුවීම් සඳහා ඉල්ලුම් කරනු ලැබුවහොත් එම අයට ප්‍රමුඛත්වය ලැබෙනු ඇත.

06. අවුරුදු තුනක් හෝ ඊට වැඩි කාලයක් දුෂ්කර ස්ථානයක සේවය කරන නිලධාරියෙකුට පහසු ස්ථානයකට මාරුවීමක් ඉල්ලුම් කරන අවස්ථාවකදී එම පහසු ස්ථානයේ වසර පහකට වැඩි සේවා කාලයක් ඇති නිලධාරියා එම ග්‍රාම නිලධාරී වසමෙන් පිටත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුල වෙනත් ග්‍රාම නිලධාරී වසමකට මාරු කිරීමට යටත්වනු ඇත.

07. මාරුවීම් ක්‍රියාත්මක විය යුතු දිනට මාස තුනකට පෙර මාරුවීම් සඳහා ඉල්ලුම් කළ යුතුය.

08. නිලධාරියාට මෙන්ම ඔහුගේ පවුලේ අයටද ඇතිවිය හැකි අපහසුතාවයන් අවම කිරීමට හැකිවන සේ, ස්ථාන මාරුවක් ලබා දීමට පහසු වීම පිණිස නිලධාරියකු ස්ථාන මාරුවීමක් ඉල්ලුම් කරන අවස්ථාවේදී ඔහු විසින් ස්ථාන මාරුව ඉල්ලා සිටින කොට්ඨාසයට අමතරව තවත් විකල්ප කොට්ඨාස තුනක් ඉල්ලුම් පත්‍රයේ සඳහන් කළ යුතුය.

09. හැකි සෑම විටම පදිංචි ස්ථානය පිහිටි වසමට හෝ ආසන්න වසමකට මාරු වීම් ලබා දීමට සලකා බැලිය හැකිය.

10. පහසු කොට්ඨාසයක සේවය කරන නිලධාරියෙකු හැර අනෙක් කොට්ඨාසයක සේවය කරනු ලබන වයස අවුරුදු 55 ඉක්මවන ලද නිලධාරීන් මාරුවීමට ඉල්ලීමක් කර නොමැති නම් විශ්‍රාම ගන්වන තෙක් එම කොට්ඨාසයේ සේවය කිරීමට අවශ්‍යතාවයන් මත ඉඩ ලබා දිය හැකිය.

11. මාරුවීම් ක්‍රියාත්මක කිරීමේදී ස්ථාන මාරුව ලබාදෙන කොට්ඨාසයේ බහුතර ජනතාව භාවිතා කරන භාෂාවෙන් රාජකාරි කිරීමට හැකි දැනුමක් ඇති නිලධාරියෙකු යෙදීමට හැකි සෑම අවස්ථාවකදීම ක්‍රියාකළ යුතු අතර නිලධාරීන්ට එම භාෂාව පිළිබඳ විධිමත් පුහුණුවක් ලබා දීමට කටයුතු කළ යුතුය.

12. තමන් සේවයට බැඳුණු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අයත් දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු වීම් කරනු ලබන්නේ විනය හේතු මත හෝ රාජකාරි අවශ්‍යතාවයන් මත හෝ නිලධාරියා සිය කැමැත්තෙන් ඉල්ලුම් කලහොත් හෝ පමණි.

13. මාරුවීම් ක්‍රියාත්මක වන දිනට මාසයකට පෙර අදාල නිලධාරීන්ට දැන්විය යුතුය. නොවැලැක්විය හැකි හේතුන් මත මසක කල් දීමක් කළ නොහැකි අවස්ථාවකදී නිලධාරියාගේ ඉල්ලීමකින් තොරව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අතර ස්ථාන මාරුවීම් ලබා දෙන නිලධාරීන්ට අදාල ගමන් වියදම් හා වෙනත් දීමනා ගෙවිය යුතුය.

14. එක් ග්‍රාම නිලධාරී කොට්ඨාසයක සේවය කළ අයෙකුට අත්‍යවශ්‍ය හේතුවකදී හැර වසර පහකට පෙර නැවත එම කොට්ඨාසයට ස්ථාන මාරු වීම් ලබා නොදිය යුතුය.

15. ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවන අයෙකුට ඒ පිළිබඳ අභියාචනා, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුල මාරුවීම් පිළිබඳව දිස්ත්‍රික් අභියාචනා මණ්ඩලයටද, දිස්ත්‍රික්කය තුල මාරු වීම් හා දිස්ත්‍රික් අතර මාරුවීම් පිළිබඳව අමාත්‍යාංශ අභියාචනා මණ්ඩලයටද ඉදිරිපත් කළ යුතුය. දිස්ත්‍රික් අභියාචනා මණ්ඩල නිර්දේශ අනුව දිස්ත්‍රික් ලේකම් විසින් ප්‍රාදේශීය ලේකම්වරුන් වෙතද අමාත්‍යාංශ අභියාචනා මණ්ඩල නිර්දේශ අනුව අමාත්‍යාංශ ලේකම් විසින් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙතද ස්ථාන මාරු සම්බන්ධ නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා දන්වනු ඇත.

16. මාරු මණ්ඩල සඳහා ආයතන සංග්‍රහයේ හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විධිවිධාන යටතේ මාරු වීම් මණ්ඩලයට කැඳවීමට සුදුසුකම් ලබන ග්‍රාම නිලධාරී වෘත්තීය සමිති සියල්ලටම සම අවස්ථාව ලබා දිය යුතුය.

17. ස්ථාන මාරු ලබාදීමේදී රජයේ වියදම අවම වන පරිදි ක්‍රියා කළ යුතුවේ.

18. ඉහත සඳහන් ප්‍රතිපත්ති අනුව මාරු මණ්ඩල නිර්දේශය මත වාර්ෂිකව ස්ථාන මාරු ක්‍රියාත්මක කරනු ඇත.

## (ආ) පරිපාලන ග්‍රාම නිලධාරීන්ගේ ස්ථාන මාරු ප්‍රතිපත්තිය

**01.** දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර හෝ දිස්ත්‍රික්ක අතර පරිපාලන ග්‍රාම නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම් දිස්ත්‍රික් මාරු මණ්ඩලයේ හා අමාත්‍යාංශ මාරු මණ්ඩලයේ නිර්දේශයත් දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ නිර්දේශයත් සලකා අමාත්‍යාංශ ලේකම් විසින් සිදු කරනු ඇත.

**02.** විශේෂ අවස්ථාවකදී හැර සියළුම ස්ථාන මාරු ජනවාරි පළමු වැනි දින සිට ක්‍රියාත්මක විය යුතුය.

**03.** එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක වසර තුනක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ට වාර්ෂික ස්ථාන මාරුවීම් ඉල්ලුම් කිරීමට සුදුස්සන් වන අතර, වසර පහක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක සේවය කර ඇති නිලධාරීන් ඉදිරි වගන්තිවල සඳහන් ව්‍යතිරේකයන්ට යටත්ව දිස්ත්‍රික්කය තුළ හෝ ඉන් පිටත වෙනත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට ස්ථාන මාරු කිරීමට යටත්වේ.

**04.** එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක වසර **05**ක් සේවය කර ඇති නිලධාරීන් අනිවාර්යයෙන්ම ස්ථාන මාරු කළ යුතු අතර. දුෂ්කර සේවා ස්ථානයක වසර **03**ක් සේවය කරන නිලධාරීන්ගේ ස්ථාන මාරු ඉල්ලීම් සඳහා ප්‍රමුඛත්වයක් ලැබේ. දිස්ත්‍රික්කයේ දුෂ්කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දිස්ත්‍රික් මාරු මණ්ඩල විසින් තීරණය කරනු ඇත.

**05.** දුෂ්කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක අවුරුදු **3**ක් හෝ ඊට වැඩි කාලයක් සේවය කරන නිලධාරියෙකුට පහසු ස්ථානයකට මාරුවීමක් ඉල්ලුම් කරන අවස්ථාවකදී එම පහසු ස්ථානයේ වසර **5**කට වැඩි සේවා කාලයක් ඇති නිලධාරියා වෙනත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට මාරු කිරීමට යටත් වනු ඇත.

**06.** නිලධාරියාට හා පවුලේ අයට සිදු වන අපහසුතා අවම වන පරිදි ස්ථාන මාරුව ලබා දීමට හැකි වන පරිදි නිලධාරියකු ස්ථාන මාරු ඉල්ලුම් කිරීමේදී ඉල්ලුම් කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අමතරව දිස්ත්‍රික්කය තුළ හෝ පිටත වෙනත් කොට්ඨාස **03**ක් ඉල්ලුම් පත්‍රයේ සඳහන් කළ යුතුය.

**07.** හැකි සෑම විටම නිලධාරියාගේ ස්ථිර පදිංචිය පිහිටි දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට හෝ ආසන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට ස්ථාන මාරු ලබා දීමට සලකා බැලිය හැකිය.

**08.** පහසු ස්ථානයක හැර අනෙක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක සේවය කරන අවුරුදු **55** ඉක්මවන නිලධාරියකු මාරු වීමට ඉල්ලීමක් ඉදිරිපත් කර නොමැති නම්, විනය හේතු හෝ රාජකාරි අවශ්‍යතා හැර අනෙක් අවස්ථාවන්හිදී විශ්‍රාම ගන්වන තෙක් එම කොට්ඨාසයේ සේවය කිරීමට ඉඩ දීමට හැකියාව ඇත.

## (ඇ) මාරු මණ්ඩල

### ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාරු මණ්ඩලය

සභාපති :- ප්‍රාදේශීය ලේකම්

සාමාජික :- 1. සහකාර ප්‍රාදේශීය ලේකම්/පරිපාලන නිලධාරි/පරිපාලන ග්‍රාම නිලධාරි
2. ග්‍රාම නිලධාරි වෘත්තීය සමිති නියෝජිතයන්

**කාර්ය භාරය**

I. ස්ථාන මාරු ලබා දිමේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අනුගමනය කළ යුතු නිර්නායකයන් පොදු ප්‍රතිපත්තියට යටත්ව සකස් කර ගැනීම.
II. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ දුෂ්කර හා පහසු ස්ථාන හඳුනා ගැනීම.
III. ඒ අනුව පොදු ප්‍රතිපත්ති හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ රීති වලට යටත්ව වාර්ෂික ස්ථාන මාරු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.

### දිස්ත්‍රික් මාරු මණ්ඩලය / දිස්ත්‍රික් අභියාචනා මණ්ඩලය

සභාපති :- දිස්ත්‍රික් ලේකම්/අතිරේක දිස්ත්‍රික් ලේකම්

සාමාජික :- 1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත මාණ්ඩලික නිලධාරියෙක්/ පරිපාලන නිලධාරි
2. ග්‍රාම නිලධාරි වෘත්තීය සමිති නියෝජිතයන්

**කාර්ය භාරය**

I. ස්ථාන මාරු සම්බන්ධව දිස්ත්‍රික්කය තුළ අනුගමනය කළ යුතු නිර්නායක පොදු ප්‍රතිපත්තීන්ට යටත්ව සකස් කර ගැනීම.
II. දුෂ්කර හා පහසු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හඳුනා ගැනීම.
III. පොදු ප්‍රතිපත්තීන්ට හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ රීති වලට යටත්ව ග්‍රාම නිලධාරීන්ගේ හා පරිපාලන ග්‍රාම නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීම සම්බන්ධව දිස්ත්‍රික් ලේකම් වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.
IV. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ සිදු කරන ලද ස්ථාන මාරු සම්බන්ධව ඉදිරිපත් වන අභියාචනා සලකා බලා දිස්ත්‍රික් ලේකම් වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.

### අමාත්‍යාංශ මාරු මණ්ඩලය

සභාපති :- ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ග්‍රාම නිලධාරි අංශය)

සාමාජික :- 1. මාණ්ඩලික නිලධාරිවරයෙක්
2. ග්‍රාම නිලධාරි වෘත්තීය සමිති නියෝජිතයන්

**කාර්ය භාරය**

I. පොදු ප්‍රතිපත්තියට යටත්ව අවශ්‍ය නිර්නායක සකස් කර දිස්ත්‍රික් අතර ග්‍රාම නිලධාරීන්ගේ හා පරිපාලන ග්‍රාම නිලධාරීන්ගේ ස්ථාන මාරු ඉල්ලීම් පිළිබඳව සලකා බලා එම ඉල්ලීම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව නිර්දේශ අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිප්ත කිරීම.

### අමාත්‍යාංශ අභියාචනා මාරු මණ්ඩලය

සභාපති :- අතිරේක ලේකම් (ස්වදේශ කටයුතු)

සාමාජික :- 1. ස්වදේශ කටයුතු අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙක්
2. ග්‍රාම නිලධාරි වෘත්තීය සමිති නියෝජිතයන්

**කාර්ය භාරය**

I. දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අතර සිදු කරනු ලබන ග්‍රාම නිලධාරීන්ගේ හා පරිපාලන ග්‍රාම නිලධාරීන්ගේ ස්ථාන මාරු වීම් සම්බන්ධව ඉදිරිපත් කරනු ලබන අභියාචනා සලකා බලා ලේකම් වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.
II. දිස්ත්‍රික් අතර අමාත්‍යාංශ මාරු මණ්ඩලයේ නිර්දේශ මත ක්‍රියාත්මක කරන ලද ස්ථාන මාරු වීම් සම්බන්ධව අභියාචනා පිළිබඳව සලකා ලේකම් වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.

## (ඈ) මාරුවීම් මණ්ඩල නිර්දේශ අනවශ්‍ය මාරුවීම්

පහත සඳහන් කරුණු එකක් හෝ කිපයක් නිසා ඒ ඒ අවස්ථාවලදී අදාල බලධාරීන්ට මාරු මණ්ඩල අනුමැතියකින් තොරව මාරු වීම් කළ හැකිය.

1. විනය හේතු මත කරනු ලබන ස්ථාන මාරු
2. සේවා අවශ්‍යතා මත කරනු ලබන ස්ථාන මාරු
3. නිලධාරීන්ගේ ඉල්ලීම මත කරනු ලබන අන්‍යොන්‍ය ස්ථාන මාරු